**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No. 6 1/B, Layards Road, Colombo 05. **Tel:** +94112584047 / +94114503001
**Fax:** +94112584047 **E-mail:** cmev@cpalanka.org **Web:** www.cmev.org

2023 පෙබරවාරි 19 දින
කොළඹ, ශ්‍රී ලංකාව.

<u>ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ සී.එම්.ඊ.වී. මාධ්‍ය ප්‍රකාශනය</u>

මැතිවරණ කොමිෂන් සභාව, භාණ්ඩාගාරය, විධායකය, රජයේ මුද්‍රණාලයාධිපතිනිය සහ ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සාහසික ලෙස උල්ලංඝනය කිරීම සී.එම්.ඊ.වී. දැඩි ලෙස හෙළා දකී. මේ එක් එක් රාජ්‍ය ආයතන සහ නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වයන් එකින් එක පරීක්ෂා කිරීමේදී ඔවුන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මුළුමනින්ම කඩාකප්පල් කිරීම සඳහා සාමූහිකව කටයුතු කර ඇති බව පෙනීයයි.

**මැතිවරණ කොමිෂන් සභාව** – නීත්‍යානුකූලව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ඇති අවසාන මොහොත දක්වා මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනය නිකුත් කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් හිතාමතා ප්‍රමාද කිරීම මගින් වත්මන් මැතිවරණය පිළිබඳ සංකීර්ණතාව ඇති කිරීමට අඩිතාලම දමා තිබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ 2022 සැප්තැම්බර් 21 වැනි දින ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට අවකාශ ලැබුන නමුත් එය 2023 ජනවාරි 4 දක්වා එය ප්‍රමාද කරන ලදී. මේ අනුව ඡන්ද විමසීම් දිනයවන විට ඉතිරි වන කාලය සති 6කුත් දින 5ක් පමණි. ඡන්ද විමසීම් දිනයෙන් පසු වත්මන් පළාත් පාලන ආයතනවල නිල කාලය දින 11 කින් අවසන් වනු ඇත. ඉහත කරුණු දෙක මගින්ම ඡන්ද විමසීම් පවත්වන දිනයන්හි අවශ්‍ය සංශෝධනයක් කිරීමට ඉතිරිවන්නේ ඉතා සීමිත ඉඩක් පමණි. මේ අතර මාධ්‍ය වාර්තා කළ පරිදි විධායක ජනාධිපතිවරයා මැතිවරණය ප්‍රකාශ කිරීමට පෙර සහ පසුව මැතිවරණ කොමිසමේ සාමාජිකයන් දෙවතාවක් සාකච්චා සඳහා කැඳවා තිබිණි. එම සාකච්ඡාවන්හි අරමුණු හා අන්තර්ගතය පිළිබඳ වගවීමෙන් යුතු පැහැදිලි කිරීමක් කොමිසම වෙතින් සිදු නොවීය. එමෙන්ම, භාණ්ඩාගාර ලේකම්වරයා ඊයේ මැතිවරණ කොමිසමේ සභාපතිවරයා හමුවී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා මුදල් නිකුත් කිරීමට භාණ්ඩාගාරයට හැකියාවක් නොමැති බව දැනුම්දී තිබුණි.

**භාණ්ඩාගාරය/විධායක** - ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව, 2023 ජනවාරි 30 වැනි දින අංක 23/0201/604/018 දරන ඇමති මණ්ඩල තීරණය මත පදනම් වෙමින් 2023 පෙබරවාරි 02 වැනි දින භාණ්ඩාගාර ලේකම් විසින් අයවැය චක්‍රලේඛ අංක 02/2023 නිකුත් කරන ලදී. විධායකය විසින් මෙම චක්‍රලේඛය හරහා පාර්ලිමේන්තුවේ මූල්‍ය බලතල අමු අමුවේ උල්ලංඝනය කිරීමක් සිදුකර ඇත. චක්‍රලේඛයේ අවසාන අපේක්ෂාව වී ඇත්තේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම අත්හිටුවා ඡන්ද විමසීම් ක්‍රියාවලිය කඩාකප්පල් කිරීම බව පැහැදිලිය. කෙසේ වෙතත්, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර දැනටමත් එකඟ වී ඇති සේවා බැඳීම් එලෙසින්ම පවත්වාගෙන යාමට අවසර දෙන බැවින් මෙම චක්‍රලේඛය රජයේ මුද්‍රණාලයට ඡන්ද පත්‍රිකා මුද්‍රණය සම්බන්ධව අදාළ නොවනු ඇත. රජයේ මුද්‍රණාලයාධිපතිනිය විසින්ම පිළිගෙන ඇති පරිදි (2023 පෙබරවාරි 17 වැනි දින ඇයගේ මාධ්‍ය ප්‍රකාශයේ) මුද්‍රණාලයාධිපතිනිය සහ මැතිවරණ කොමිසම අතර 2023 ජනවාරි 23 වැනි දින ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම පිළිබඳ නිල සන්නිවේදනයක් සිදු කරන ලදී. එබැවින් ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමේ ගිවිසුම භාණ්ඩාගාර චක්‍රලේඛයට පෙර සිදු විය. එම නිසා අයවැය චක්‍රලේඛ මත රැදෙමින් ඡන්ද පත්‍රිකා මුද්‍රණය හා භාරදීම ප්‍රමාද කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංගනය කිරීමේ වරද සිදු කරමින් සිටී.

**රජයේ මුද්‍රණාලය** - මැතිවරණ කොමිෂන් සභාවට අනුව, 2023 පෙබරවාරි 14 වන විට රජයේ මුද්‍රණාලය විසින් අවශ්‍ය තැපැල් ඡන්ද පත්‍රිකා සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය ප්‍රමාණය ලබා දීමට සහතික වූ අතර, ඒ අනුව පෙබරවාරි 15 වන දින දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් වෙත තැපැල් ඡන්ද පත්‍රිකා සහ ලිපි ද්‍රව්‍ය නිකුත් කිරීමට සැලසුම් කර තිබුණි. අනතුරුව රජයේ මුද්‍රණාලයාධිපතිනිය විසින් 2023 පෙබරවාරි 13 වැනි දින මැතිවරණ කොමිෂන් සභාව වෙත හදිසි ලිපියක් මගින් හිග අත්තිකාරම් ගෙවනතුරු ඡන්ද පත්‍රිකා මුද්‍රණයේ දුෂ්කරතාව පිළිබඳ වැඩිදුර උපදෙස් ඉල්ලා සිටියේය. මෙම හේතුවෙන් නියමිත දිනට මුද්‍රිත ඡන්ද පත්‍රිකා නොලැබීම මත මැතිවරණ කොමිසමට තැපැල් ඡන්දය නියමිත පරිදි නොපවත්වා කල් දැමීමට සිදු විය. රජයේ මුද්‍රණාලයාධිපතිනියගේ අත්තනෝමතික තීරණ සහ දුර්වල පැහැදිලි කිරීම් නිසා ඇය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රියාවලිය කඩාකප්පල් කිරීමේ අරමුණින් සිටි බවට සාධාරණ සැකයක් ඇති කරයි.

**ශ්‍රී ලංකා පොලිසිය** - රජයේ මුද්‍රණාලයාධිපතිනිය 2023 පෙබරවාරි 17 වැනි දින සිදුකළ මාධ්‍ය ප්‍රකාශයට අනුව, දුරකථනයෙන් සහ ලිඛිතව නැවත නැවත සිදුකළ ඉල්ලීම් වලින් පසුවද ශ්‍රී ලංකා පොලිසිය ඡන්ද පත්‍රිකා මුද්‍රණයට අවශ්‍ය ප්‍රමාණවත් ආරක්ෂාව සැපයීමේ රාජකාරිය පැහැර හැර ඇත. රජයේ මුද්‍රණාලයාධිපතිනිය මාධ්‍ය වෙත අනාවරණ කළේ පසුව තමන් අවශ්‍ය පොලිස් ආරක්ෂාව නොමැතිව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම ආරම්භ කළ බවයි. මැතිවරණ කොමිසමේ කොමසාරිස් ජනරාල්වරයා තහවුරු කළේය 2023 ජනවාරි 23 වැනිදා ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය පොලිස්

ආරක්ෂාව ලබාදෙන ලෙස පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටි අතර පොලිස්පතිවරයා බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු අදාළ නිලධාරීන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීමට උපදෙස් ලබාදුන් බවත්ය. මේ අතර පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිහාල් තල්දූව ඊයේ මාධ්‍ය වෙත දන්වා සිටියේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය ආරම්භ කරන බවට පොලිසියට තොරතුරක් නොමැති බැවින් ආරක්ෂාව ලබා නොදුන් බවත්, ඡන්ද පත්‍රිකා මුද්‍රණය ආරම්භ කරන විට ආරක්ෂාව ලබාදෙන බවත්ය. ඡන්ද පත්‍රිකා මුද්‍රණයට අවශ්‍ය ආරක්ෂාව ලබාදීමට පළමුව එකඟ වී පසුව ලබානොදීමෙන් අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් මැතිවරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීමට ඇති ව්‍යවස්ථාපිත වගකීම චේතනාන්විතව උල්ලංඝනය කළ බව මෙම තොරතුරු සනාථ කරයි.

**ඉහත සියලු රාජ්‍ය අධිකාරීන් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් තම ව්‍යවස්ථාපිත යුතුකම් සහ ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බව සී.එම්.ඊ.වී. හි අදහසයි. මෙම කඩ කිරීම්වලට එරෙහිව අවශ්‍ය සියලු විනය හා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් සහ ඒ වෙනුවෙන් වගවීමට කටයුතු කරන ලෙසත් සී.එම්.ඊ.වී.ය රජයෙන් දැඩි ලෙස ඉල්ලා සිටී. පාර්ලිමේන්තු පරීක්ෂණයක් ආරම්භ කර පළාත් පාලන** ආයතන ඡන්ද විමසීම් **ක්‍රියාවලිය කඩාකප්පල් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ලබා දී ක්‍රියාත්මක කරන ලෙසත් සී.එම්.ඊ.වී.ය** වැඩිදුරටත් **පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටී.**



ආචාර්ය පී සරවනමුත්තු
සම කැඳවුම්කරු



ලසන්ත ද සිල්වා
සම කැඳවුම්කරු



උදය කළුපතිරණ
සම කැඳවුම්කරු



West Seylan Tower, #9A | 90 Galle Road | Colombo 3, Sri Lanka
Phone: +94 11 245 2694 | www.IFES.org